**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2018**

**1.1 මතය ව්‍යාචනය**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. 2018 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමානවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත 01 ක ප්‍රකාරව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවද, එයට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් අරමුදලට ලැබෙන මුදල්, මුදල් පදනම මත ගිණුම් ගත කරන බව හෙළිදරව් කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයෝජන වටිනාකම රු. 642,000,000 ක් සඳහා 2018 වර්ෂයට අදාළව පොළී ආදායම රු.1,772,975 අඩුවෙන් හා රඳවා ගැනීමේ බදු රු. 2,079,025 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 3,852,000 අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | කාල පරිච්ඡේදයට අදාල පොළී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම් ගත කල යුතු විම. |

### 1.5.4 පැහැදිලි නොකළ වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රාජ්‍ය ආයතන විසින් අරමුදලට සිදුකරන ලද හර හා බැර කිරීම්වලට අදාල හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමට ගලපා තිබුණි. එම ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට හර ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 29,448,892 ක් වුවද, ඊට අදාල උපලේඛනය අනුව ශේෂය රු. 24,158,246 ක් වුයෙන් රු. 5,290,646 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය පිළිගනිමි. | වාර්ෂිකව ගැලපුම් ගිණුමේ ශේෂ වෙන වෙනම අදාල ආයතන සමඟ සැසඳුම් කර නිවැරදි ගිණුම්වලට ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| අනිවාර්ය දායක මුදල් ගිණුම, ස්වේච්ඡාදායක මුදල් ගිණුම, රජයේ දායක මුදල් ගිණුම | රු. 62,071,934,809 | අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම. | රාජ්‍ය සේවා අරමුදලට සියයට 8 හා සියයට 12 ලෙස එක් එක් ආයතන මගින් එවන ලද මුදල් ලැබීම් ලේඛනයේත් සියයට 8 හා සියයට 12 ලෙස ගෙවීම් වෙන්කර ගෙවීම් ලේඛණයේත් සටහන් කරනු ලබයි. වර්ෂයේ ආරම්භක ශේෂයට වර්ෂය තුල ලැබීම් වලින් ගෙවීම් අඩුකර වර්ෂයේ ලාභ විසර්ජනයන් | අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගැනිම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත |

එකතු කිරීමෙන් අනිවාර්ය දායක යුතු වීම. මුදල් ගිණුමේ, රජයේ දායක මුදල් ගිණුම් හා ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය ගණනය කර ඇත.

## 1.6 ලැබිය යුතු ගිණුම

2018 දෙසැම්බර් 31 දිනට උපලේඛණය අනුව ගැලපුම් ගිණුමේ ශේෂයෙන් රු. 19,854,328 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් දක්වාත් රු. 3,187,045 ක් වර්ෂ 4 ක සිට වර්ෂ 6 ක් දක්වාත් රු.874,093 ක් වර්ෂ 7 ක සිට වර්ෂ 10 ක් දක්වාත් සහ රු. 125,362 ක් වර්ෂ 11 ට වඩා පැරණි ශේෂයන් විය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) | | | |
| (i) 16 (1ආ) සහ 20 (ආ) වගන්ති | අකාර්යක්ෂමභාවය, විෂමාචාරය යන හේතුව මත දායකයකු සේවයෙන් පහ කරනු ලබන විට හෝ අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධූරයකට පත්කරනු ලැබූ විට රජයේ දායකය හා පොළිය නිලධාරියා වෙනුවෙන් එකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතු වුවත් 2018 වර්ෂයට අදාල රු.313,813,696 ක් නොගෙවූ රජයේ දායක මුදල් හා පොළිය ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 20 වගන්තිය හා 16 වගන්තිය යටතේ ගෙවිය යුතු රජයේ දායක මුදල හා ඊට අදාල පොළිය 2017 වර්ෂය දක්වා නිරවුල් කර ඇත. 2018 වර්ෂයේ දී ගෙවිය යුතු මුදල 2019 වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කෙරේ. | නොගෙවූ රජයේ දායක මුදල් හා පොළිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. . |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සුදුසු ක්‍රමයක් සකස් කිරීමට උත්සාහ ගනු ලැබුවද ගැටළු සහගත තත්වයක් හේතුවෙන් ප්‍රමාද වී ඇත. ඒ සඳහා අඛණ්ඩව කටයුතු කෙරේ. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 08 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන අනුව මාසික ගිණුම් සාරාංශ මගින් දායක මුදල් බැරකිරීම සිදු නොකළ යුතු වුවත්, 2018 වර්ෂය තුල ආයතන 13 කින් දායක මුදල් රු. 50,353,743 ක් මාසික ගිණුම් සාරාංශ මගින් දායක මුදලට බැර කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | චක්‍රලේඛයට අනුගතව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,779,940,754 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,642,414,331 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,137,526,423 වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන මත පොළී ආදායම් රු. 1,189,752,778 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකය ලෙස ආයතන විසින් එවන චෙක්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තැපැල් අංශයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය වෙත ලබා දීමට මාස 01 සිට මාස 14 දක්වා වූ කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | විවිධ ආයතන විසින් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙත තැපැල් මඟින් චෙක්පත් යොමු කරනු ලබන අතර, චෙක්පත් දිනය හා අර්ථ සාධක අරමුදල් කාර්යාලීය ලේඛනයේ චෙක්පත් ලැබීම් ලේඛනයේ සටහන් වන දිනය අතර කාල පරාසයන් සමහර අවස්ථාවල දක්නට ඇත. | ලැබෙන ආදායම් හැකිතාක් ඉක්මනින් උපලබ්ධි කිරීමට කටයුතු කල යුතු බැවින් චෙක් පත් තැපැල් අංශයට ලද වහාම රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් අංශය වෙත ලබා ගැනීම සඳහා අවශ්‍ය පාලන පද්ධති හඳුන්වා දිය යුතුවීම. |

| | | |
|---|---|---|
| (ආ) රජයට ලැබෙන ආදායම හැකිතාක් ඉක්මනින් උපලබ්ධි කිරීමට කටයුතු කළ යුතු වුවත් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබෙන චෙක්පත් දින 8 සිට මාස 1 ½ ක් ප්‍රමාදයකින් බැංකු ගත කර තිබුණි. | චෙක්පත් ප්‍රේෂණය කිරීම සම්බන්ධව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 07/2015 මගින් උපදෙස් ලබාදී ඇති අතර, මාසිකව අයකරනු ලබන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ඊලඟ මාසයේ 10 වෙනි දිනට ප්‍රථමව එවිය යුතු බව තවදුරටත් එමඟින් අවධාරණය කර ඇත. | රජයට ලැබෙන ආදායම් හැකිතාක් ඉක්මනින් උපලබ්ධි කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) 2018 සැප්තැම්බර් මස කරන ලද නියැදි පරික්ෂණයට අනුව 2018 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසයන්හි ආපසු හරවා යවන ලද නමුත් නැවත දායක මුදල් ගෙන්වාගෙන නොතිබුණු වටිනාකම රු. 1,989,639 ක් වූ චෙක්පත් 43 ක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය පිළිගනිමි. එබඳු තත්වයක් යලි ඇති නොවන පරිදි අංශය වෙත ලැබෙන චෙක්පත් කඩිනමින් බැංකුව වෙත ප්‍රේෂණය කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | චෙක්පත් හැකි ඉක්මනින් බැංකු ගත කිරීමටත් හරවා යවනු ලබන චෙක්පත් සඳහා නැවත දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ඈ) විශ්‍රාම වැටුප් නොලැබෙන රජයේ ඇතැම් සේවකයන් හට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික අරමුණුගතව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පිහිටුවා තිබුණි. 2018 ජනවාරි 01 දිනට නොගෙවූ අයදුම්පත් 954ක් තිබූ අතර වර්ෂය තුළ අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍ර සංඛ්‍යාව 3,555 ක් විය. ඒ අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 3,917 ක් සඳහා රු. 354,979,757 ක් ගෙවීම් කර තිබූ අතර අයදුම්පත් 592 ක් සඳහා ගෙවීම් කර නොතිබුණි. | මෙම ඉතිරි වී ඇති අයදුම්පත් 592 තුල පවතින අසම්පූර්ණ අයදුම්පත් සඳහා ආයතන දැනුවත් කර එම අඩුපාඩු අංශය වෙත ලැබෙන තෙක් ගෙවීම් කිරීමට නොහැකි අයදුම්පත්ද ඇතුලත් වේ. එබැවින් ප්‍රතිලාභ ලබා ගැනීමට ඉදිරිපත් වන ලිපි ගොනුවල පවතින අඩුපාඩු මත සියලුම අයදුම්පත් සඳහා එකවර ගෙවීම් කල නොහැකි වී ඇත. | ආයතනවලින් ලැබෙන අයදුම්පත්වල පවතින අඩුපාඩු අවමකර ගැනීමට උපදෙස් ලබාදීමට කටයුතු කිරීම තුලින් අයදුම්පත් සඳහා නොපමාව ගෙවීමට කටයුතු කළ යුතු වීම |